**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 29 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු මූලධන වියදම් රු. 6,295,678 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂයේ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු මූලධන ආදායම් රු. 6,208,700 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලෙජර් ගිණුම්වල ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වලට පිටපත් කිරීමේදී සිදුවී ඇති වැරදි හේතුවෙන් වර්ෂයේ පුනරාවර්තන වියදම රු. 430,000 කින් අධි තක්සේරු වී තිබුණි. | වර්ෂයේ වියදම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල සේවක ණය පොළී ආදායම රු. 341,592 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | මුදල් පොතේ ශේෂය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුදල් ශේෂය අතර රු. 123,821 ක වෙනසක් පැවතුණි. | මුදල් පොතේ ශේෂය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් ශේෂය අතර වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 10,257,640 ක වෙනසක් පැවතුණි. | පෙර වර්ෂවල සිට පැවතඑන මෙම වෙනස්කම් වලට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතුවේ. | අදාල වෙනස්කම් පෙර වර්ෂවල සිට පවතින බවත් ඉදිරියේදී වෙනසට හේතුව සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

--------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | 1988 සිට 2018 දක්වා කාලය තුල අවස්ථා 33 කදී ලබා දී තිබූ රු. 1,728,579 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 1988 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ නොපියවූ අත්තිකාරම් රු. 1,138,226 ක් කපා හැරීමේ අනුමැතිය සඳහා යොමුකර ඇති බවත් ඉතිරි අත්තිකාරම් පියවීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 15 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව කඩිනමින් සිදුකිරීමට කටයුතු කරන බව දන්වමි. |
| | (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 (i) ඡේදය | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලද ඩබල් කැබ් රථයේ ලියාපදිංචි අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම කැබ් රථය පවරා ගැනීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇතත් මෙතෙක් පවරාදීම් සිදුකර නොමැති බව දන්වමි. |
| (ඉ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර සේවාලාභියාට අවශ්‍ය පහසුකම් ලබාදිය යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 18,534,795 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,124,128 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,631,131 | 5,732,840 | 6,862,416 | 3,007,304 | 7,237,764 | 6,838,944 | 5,204,861 | 5,904,263 |
| කුලී | 12,085,487 | 11,639,465 | 11,218,661 | 445,162 | 12,062,300 | 11,648,839 | 11,648,839 | - |
| බලපත්‍ර ගාස්තු | 1,704,000 | 1,522,475 | 1,466,275 | 195,600 | 1,477,000 | 1,616,154 | 1,877,354 | 199,400 |
| වෙනත් ආදායම් | 22,929,800 | 26,557,946 | 18,081,932 | 16,223,389 | 16,833,300 | 17,986,342 | 27,500,683 | 7,321,600 |
| | 43,350,418 | 45,452,726 | 37,629,284 | 19,871,455 | 37,610,364 | 38,090,279 | 46,231,737 | 13,425,263 |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 1,726,967 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. 1,356,622 ක් ඇතුලත් වී තිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2017 වර්ෂයේ සිදු කරන ලද නව තක්සේරුව මත 2020 වර්ෂයේ සිට බදු අයකිරීමට කටයුතු කර ඇති බැවින් පවතින ගැටළු විසඳාගෙන ආදායම් රැස්කර ගැනීමට අපේක්ෂා කරන බව දන්වමි. |

2.2.3 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසන් වනවිට අයවිය යුතුව පැවති හිඟ ජල ගාස්තු රු. 2,568,482 ක් වූ අතර, ඒ තුල වසර 05 ට වඩා වැඩි කාල සීමාවක් හිඟහිට ඇති රු. 1,078,594 ක් පැවතුණි. අයකල නොහැකි බවට තීරණය කල රු. 1,356,229 ක් කපාහැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යොමුකර තිබූ අතර, හිඟ ගාස්තු අයකර ගැනීම සඳහා සභාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පල්ලෙබැද්ද ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයින් 23 දෙනෙකුගේ ජල සැපයුම විසන්ධි කර ඇති බවත්, එම ව්‍යාපෘතියේම හිඟ ජල ගාස්තු රු. 55,980 ක් සම්බන්ධයෙන් සමථ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති බවත් ජංගම සේවා මඟින් හිඟ ජල ගාස්තු අයකර ගැනීමට අපේක්ෂා කරන බවත් දන්වමි. |

2.2.4 වෙළඳ බලපත්‍ර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍ර ලබාගැනීම සඳහා අයදුම්පත් 248 ක් ලැබී තිබුණද, මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශය ලැබීම ප්‍රමාදවීම හේතුවෙන් නිකුත් කර තිබූ බලපත්‍ර සංඛ්‍යාව 27 ක් විය. | වෙළඳ බලපත්‍ර ලබා ගතයුතු සියළු ආයතන වෙත වර්ෂයේ පළමු කාර්තුව තුල වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව දන්වමි. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 16,210,240 ක් වූ අතර, ලැබිය යුතු මුද්දර ගාස්තු 2020 මාර්තු වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකරගත යුතුවේ. | 2019 අප්‍රේල් දක්වා උසාවි දඩ උපලේඛන පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත සකස් කර යවා ඇති අතර, රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2019 ජූනි දක්වා මුද්දර ගාස්තු මුදල් ලැබී ඇති බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අයවැය ලේඛනය අනුව වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ සංවර්ධන කාර්යයන් 78 න් 77 ක්ම ඉටුකර නොතිබූ අතර, අයවැය ලේඛනයට ඇතුලත් නොවූ ඇස්තමේන්තුගත වියදම රු. 3,394,458 ක් වූ සංවර්ධන කාර්යයන් 06 ක් ඉටු කර තිබුණි. | වාර්ෂික අයවැය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගත යුතුවේ. | ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය මහ සභා තීරණ අනුව සිදුකරනු ලබන බව දන්වමි. |

#### (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල මසකට කසළ ටොන් 180 ක් පමණ ජනනය වුවද, ජාතික ප්‍රතිපත්ති වලට අනුකූලව විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | කසළ කළමනාකරණ කටයුතු සිදු කිරීමට සභාව සතුව නිශ්චිත ඉඩමක් නොමැති බැවින් ඉඩමක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

#### සේවක පුරප්පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේකම් තනතුර 2013 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති අතර, ඒ සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් අනුයුක්ත කරමින් පැවතුණි. අනුමත | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලේකම් තනතුර සඳහා ඉල්ලීම් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවත්, කාර්මික නිලධාරී පුරප්පාඩුව පිළිබඳ |

| | | |
|---|---|---|
| කාර්මික තනතුරු දෙකෙන් එක් තනතුරක් 2016 දෙසැම්බර් සිට පුරප්පාඩුව පැවතුණි. | | කිහිපවතාවක් ඉල්ලීම් කර ඇති බවත් දන්වමි. |

**3.3 මතබේදයට තුඩුදුන් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාපතිවරයා වෙත මහා සභාව විසින් අනුමත කරන ලද ඉන්ධන ලීටර් 750 ක් මාසිකව ලබාදෙමින් පැවතියදී ඊට අමතරව රු. 5,000 ක මාසික ඉන්ධන දීමනාවක් ද ගෙවීම් කර තිබුණි. 2018 මැයි සිට 2019 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුල එසේ ගෙවීම් කර තිබුණු ඉන්ධන දීමනාවල එකතුව රු. 95,000 ක් විය. | මාසික ඉන්ධන දීමනාවක් ගෙවීම අවිධිමත් වේ. | පපාකො චක්‍රලේඛ 03/2012(01), හා 2014 නොවැම්බර් 28 හා 2014 දෙසැම්බර් 08 දිනැති ලිපි අනුව සභාපතිවරයාට රු. 5,000 ක දීමනාවක් ගෙවීමට අනුමැතිය ලැබී ඇති බවත්, සභා තීරණයක් මත සභාපතිවරයාගේ නිල රථය සඳහා ඉන්ධන ලීටර 750 ක් ලබාදෙන බවත් දන්වමි. |
| (ආ) | 2011 වර්ෂයේදී මහනැගුම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති 07 ක ඉදිකිරීම් කටයුතු පවරා දී තිබුණු ප්‍රජාපාදක සංවිධාන වෙත එම කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයාදීමට සභාවේ කිසිඳු බැඳියාවක් නොතිබියදී සහ අනුමැතියකින්ද තොරව සභාපතිවරයා විසින් පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගතවී අවශ්‍ය කුට්ටිගල් සපයා දී තිබුණි. ඊට අදාලව එම සමාගමට ගෙවිය යුතුව පැවතුණු රු. 2,088,000 ක් අඩුකර ගැනීමකින් තොරව කර්මාන්ත 04 ක අවසන් බිල්පත් හා රැඳවුම් මුදල් අදාල සමිති වෙත ගෙවීම් කර තිබුණි. එම කර්මාන්ත 04 ට අදාලව කුට්ටි ගල් සැපයූ සමාගම වෙත ගෙවිය යුතු රු. 1,308,780 ක් නොගෙවීම හේතුවෙන් අදාල සමාගම විසින් සභාවට විරුද්ධව නඩු පවරා තිබුණු අතර, 2019 ජූලි වනවිට අදාල නඩුවේ නීතිඥ ගාස්තු ලෙස රු. 111,475 ක් වැයකර තිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිවයුත්තන් හඳුනාගත යුතුවේ. | මෙම නඩුව දැනට අධිකරණයේ විභාගවෙමින් පවතින අතර ඒ වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරයාට සභා අනුමැතිය මත නිතීඥ ගාස්තු ගෙවා ඇති බව දන්වමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එවකට සිටි සභාපතිවරයාගේ භාවිතය සඳහා 2011 අප්‍රේල් මස රු. 88,950 ක් වැයකර මිලදීගෙන තිබුණු ලැප්ටොප් පරිගණකය ඔහු 2012 වර්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස පත්වී යාමේදී ආපසු ලබාගෙන නොතිබුණි. | සභාව සතු වත්කම්වල පැවැත්ම හා ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු අතර, අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 ජනවාරි 16 දින මහ සභාව විසින් ගන්නා ලද තීරණය අනුව නීතිමය කටයුතු ආරම්භ කර ඇති බව දන්වමි. |

**3.4.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 හා 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් ඌන ලෙස හඳුනාගෙන තිබූ ප්‍රධාන කාර්යාලයට අයත් භාණ්ඩ වර්ග 42 කට අදාල ඒකක 174 ක ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අපේක්ෂා කරන බව දන්වමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු නමුත් රු. 3,299,480 ක් වටිනා ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අනුමත කරගත යුතුවේ. | 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව මිලදී ගැනීම් සිදුකිරීමට කටයුතු සම්පාදනය කර ඇති බව දන්වමි. |

**3.5.2 සැපයීම් හා සේවා**

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර තිබුණද, ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. එමෙන්ම ටයර් හා ටියුබ් මිලදී ගැනීම සඳහා සභාවේ ලියාපදිංචි සැපයුම්රුවන් සිටියදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4.3 (ඇ) ට පටහැනිව ලියාපදිංචි එක් සැපයුම්කරුවෙකුගෙන් හා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් මිල ගණන් කැඳවා රු. 952,200 ක් වැයකර ටයර් හා ටියුබ් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා සැපයුම් කරුවන්ගේ ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කර ඇති බවත්, ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගන්නා බවත් දන්වා තිබුණි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**නොවිසඳී ඇති නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් රැස් කරනු ලබන දිරන හා නොදිරන කසළ වෙන්කිරීමකින් තොරව චන්ද්‍රිකා වැව ආසන්නයේ පිහිටි රජයේ හිස් ඉඩමකට මුදා හරිමින් පැවතුණි. අවිධිමත් කසළ බැහැර කිරීම් හේතුවෙන් වැවෙහි ජලය අපවිත්‍ර වන බවත්, නොදිරන අපද්‍රව්‍ය හේතුවෙන් ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමේ අවදානමක් පවතින බවත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වරයා වාර්තා කර තිබූ අතර, අපද්‍රව්‍ය චන්ද්‍රිකා වැව ඉස්මත්තට බැහැර කිරීමට එරෙහිව ප්‍රදේශවාසීන් හා විවිධ සංවිධාන විසින් උද්ඝෝෂනද පවත්වා තිබුණි. | සුදුසු භූමියක් පවරාගෙන විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | කසළ කළමනාකරණ කටයුතු සිදු කිරීමට සභාව සතුව නිශ්චිත ඉඩමක් නොමැති බැවින් ඉඩමක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |